# අයවැය පොරොන්දු: මැති සබයෙන් ඔබ්බට

2017 වසර අවසානයේ තක්සේරුව

October 2021

© Verité Research

# පටුන

"අයවැය පොරොන්දු: මැති සබයෙන් ඔබ්බට" ........ 3
ඇගයීම් ක්‍රමවේදය ........ 3
1. වියදම් යෝජනා ........ 4
1.1. විවෘතභාවය ඇගයීම ........ 4
1.2. රජයේ ආයතනවල විවෘතභාවය ශ්‍රේණිගත කිරීම ........ 5
1.3. ප්‍රගතිය මැනීම ........ 6
2. ප්‍රතිපත්ති යෝජනා ........ 8
2.1. ප්‍රගතිය මැනීම ........ 8
3. ප්‍රගතිය, විවෘතභාවය සහ ශ්‍රේණිගත කිරීමේ තක්සේරු පිළිබඳ විස්තර ........ 9

## "අයවැය පොරොන්දු: මැති සබයෙන් ඔබ්බට"

2017 වසරේ අරඹන ලද "අයවැය පොරොන්දු: මැති සබයෙන් ඔබ්බට" වාර්ෂිකව අයවැය කතාවෙහි සඳහන් පොරොන්දු ඉටුකිරීමෙහිලා රජයේ කාර්ය සාධනය වාර්තා කරන publicfinance.lk යටතේ ඇති ඩෑෂ්බෝර්ඩයක් වේ

ආණ්ඩුව ඉදිරිපත් කරන වාර්ෂික අයවැය කතාවෙහි අයවැය පොරොන්දු පිළිබඳ මූලික ප්‍රශ්න දෙකකට පිළිතුරු සෙවීම මෙම ඩෑෂ්බෝර්ඩය මූලික අරමුණ වේ.

- (i) රජය ක්‍රියාවට නංවන්නේ පවසන දෙය ද?
- (ii) රජය පවසන්නේ ක්‍රියාවට නංවන දෙය ද?

මෙම ඩෑෂ්බෝර්ඩය හරහා ඉහත ප්‍රශ්න වලට පිළිතුරු ජනතාවට ලබා දීමෙහි අරමුණ වන්නේ,

- (i) රජයේ අයවැය පොරොන්දු සම්බන්ධව විවෘතභාවය වර්ධනය කිරීම සහ
- (ii) අයවැය පොරොන්දු ඉටුකිරීම සම්බන්ධව රාජ්‍ය ආයතනවල වගවීම වර්ධනය කිරීමයි

## ඇගයීම් ක්‍රමවේදය

අයවැය කතාවේ සඳහන් රුපියල් මිලියන 500කට වඩා වැඩි නව වැය යෝජනා හෙවත් පොරොන්දු වෙනුවෙන් වෙන්කළ ප්‍රතිපාදනවල ප්‍රගතිය මෙම ඩෑෂ්බෝර්ඩය මගින් විමසා බැලේ. මෙම යෝජනා අයවැය ලේඛනයෙහි 2 වන ඇමුණුමෙහි සඳහන් වේ. 2019 දී මෙම වේදිකාව ප්‍රතිපාදන වෙන් කිරීමක් නොමැති, නීති සහ රෙගුලාසි වල වෙනස්කම් වැනි ප්‍රතිපත්ති යෝජනා විමසා බැලීම ආරම්භ කරන ලදී.

| වසර | තෝරාගත් වියදම් යෝජනා | | | තෝරාගත් ප්‍රතිපත්ති යෝජනා |
|---|---|---|---|---|
| | තෝරා ගැනීමේ සීමාව[1] | යෝජනා ගණන | යෝජනා වල මුළු වටිනාකම | යෝජනා ගණන |
| 2017 | රු. බිලියන 1ට වැඩි | 37 | රු. මිලියන 116,910 | 0 |
| 2018 | රු. බිලියන 1ට වැඩි | 38 | රු. මිලියන 149,350 | 0 |
| 2019 | රු. මිලියන 500 ට වැඩි | 37 | රු. මිලියන 100,875 | 22 |

වසරකට දෙවතාවක් යාවත්කාලීන කරන මෙම ඩෑෂ්බෝර්ඩය නව වියදම් විවෘතභාවය සහ ප්‍රගතිය යන දර්ශක

[1] 2017 සහ 2018 දී තෝරා ගැනීමේ සීමාව පදනම් වූයේ යෝජනා සඳහා යෝජිත වියදම් වෙන් කිරීම මත පමණි. අයවැය කථාවේ වාර්තාකරණ ආකෘතියේ වෙනසක් හේතුවෙන් 2019 දී තෝරා ගැනීමේ සීමාව පදනම් වූයේ යෝජිත ප්‍රතිපාදන යෝජනාව සහ එයට දැනටමත් වෙන් කර ඇති මුදල එකතු කිරීම මත ය.

දෙකක් යටතේ ඇගයීමට [2]ලක් කරයි.ප්‍රතිපත්ති යෝජනා ක්‍රියාත්මක කිරීම තනි ප්‍රගති දර්ශකයක් භාවිතයෙන් නිරීක්ෂණය කරනු ලැබේ. ප්‍රතිපත්ති යෝජනා වල තත්වය ප්‍රධාන වශයෙන් ඇගයීමට ලක් කරනු ලැබුවේ ප්‍රසිද්ධියේ ලබා ගත හැකි තොරතුරු හරහා වන අතර තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ ගොනු කරන ලද ඉල්ලීම් මත රැඳී සිටීමෙන් නොවේ. එබැවින් ප්‍රතිපත්ති යෝජනා ඇගයීමට ලක් කිරීමේදී විවෘතභාවය පිළිබඳ දර්ශකයක් නොමැත.

ආණ්ඩුවේ අර්ධ වාර්ෂික කාර්ය සාධනය එම වසරේ ඔක්තොබර් මස තුළදීද, සමස්ථ වාර්ෂික කාර්ය සාධනය ඊළඟ වසරේ අප්‍රේල්/ මැයි මස තුළදීද එළි දක්වයි.[2]

# 1. වියදම් යෝජනා

## 1.1. විවෘතභාවය ඇගයීම

මෙම දර්ශකය, අයවැය යෝජනා සමබන්ධයෙන්, රජය පවසන්නේ ක්‍රියාවට නංවන දෙයද යන්න අධ්‍යයනය කෙරේ. මෙහි දී අගයීමට ලක් කරන්නේ අයවැය පොරොන්දු වල ප්‍රගතිය පිළිබඳ තොරතුරු කොපමණ දුරට රජය හෙළිදරව් කරන්නෙද යන්නයි. මේ සඳහා අවශ්‍ය අයවැය පොරොන්දුවලට අදාළ තොරතුරු අදාළ රාජ්‍යය ආයතනයේ වෙබ් අඩවි පරීක්ෂා කිරීම සහ තොරතුරු දැනගැනීමේ පණත (RTI) යටතේ රාජ්‍යය ආයතන වෙත තොරතුරු ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කිරීම මගින් රැස්කර ඇත. 2017 සහ 2018 වර්ෂවලදී රජයේ ආයතන වෙත ගොස් සහ එම ආයතන වෙත අවිධිමත් ඉල්ලීම් කර ද තොරතුරු රැස් කරන ලදී. කෙසේ වෙතත්, එම තොරතුරු රැස් කිරීමේ ක්‍රමය මේ වනවිට අත්හිටුවා ඇත.

අර්ධ වාර්ෂික ඇගයීමේදී, වසරේ පළමු මාස හය තුළ අයවැය පොරොන්දු ප්‍රගතිය සම්බන්ධයෙන් තොරතුරු හෙළි කිරීම අගයන අතර, වසර අවසානයේ ප්‍රගතිය සම්බන්ධයෙන් තොරතුරු හෙළි කිරීම සමස්ත වසර අවසානයේදී ඇගයීමට ලක් කරයි.

ඇගයීම කරන අවස්ථාවේ දී ලබා ගත හැකි තොරතුරු මත පදනම්ව විවෘතභාවය පහත පරිදි වර්ගීකරණය කර ඇත.

| | | |
|---|---|---|
|  | **ආවෘත** | **සමස්ථ වසර තුල ප්‍රගතිය ඇගයීමට අවශ්‍ය කිසිදු තොරතුරක් නැත** |
|  | සීමිත | තිබෙන තොරතුරු සමස්ථ වසර තුල ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් නැත |
|  | උදාසීන | ප්‍රගතිය පිළිබඳ තොරතුරු ලබාගැනීමට සහ/හෝ ලබා දුන් තොරතුරු භාවිතා කරමින් ප්‍රගතිය ඇගයීමට දැඩි පරිශ්‍රමයක් දැරීමට සිදුවිය |
|  | සාධනීය | අයවැය පොරොන්දුවේ ප්‍රගතියට අදාළ තොරතුරු අදාළ කාලය තුළ ඉල්ලුම් කිරීමෙන් ලබාගත හැකිය |

[2] 2019 අයවැය කථාව ප්‍රමාද වී 2019 මාර්තු මාසයේදී පමණක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ බැවින් 2019 දී වසර අවසානයේ ඇගයීම පමණක් සිදු කරන ලදී.


## 1.2. රජයේ ආයතනවල විවෘතභාවය ශ්‍රේණිගත කිරීම

ඒ ඒ රාජ්‍ය ආයතනය තමන් ක්‍රියාත්මක කිරීමට බැඳී සිටින පොරොන්දු පිළබඳ තොරතුරු හෙළිදරවු කිරීම මත පදනම්ව එම ආයතනවල විවෘතභාවය පිළිබඳ සංසන්දනාත්මක ශ්‍රේණිගත කිරීමක් මෙමඟින් සපයයි. සෑම ආයතනයකටම 0 සිට 100 දක්වා ලකුණු ලැබෙනු ඇති අතර ඉහළම ලකුණු මට්ටම පෙන්නුම් කරන්නේ ලකුණු 100 කින්ය. අනතුරුව, වර්ෂය තුළ ඔවුන්ගේ සාපේක්ෂ ක්‍රියාකාරිත්වය පෙන්නුම් කරමින්, වැඩිම ලකුණු ගත් ආයතනයේ සිට අඩුම ලකුණු ගත ආයතනය දක්වා රාජ්‍ය ආයතන ඉහළ සිට පහළට ශ්‍රේණිගත කරනු ලැබේ.

රාජ්‍ය ආයතනය සඳහා වන සමස්ත ලකුණු ගණනය කරනු ලබන්නේ එම ආයතනයේ විෂය පථයට අයත් එක් එක් පොරොන්දුවේ ලකුණු වල බරිත සාමාන්‍යක් ලෙස ය. සෑම පොරොන්දුවක්ම 0 සිට 100 දක්වා පරාසයක් තුල ඇගයීමට ලක් කෙරේ. සෑම පොරොන්දුවක් සඳහාම ලකුණු ගණනය කරන (i) පොරොන්දුවේ ප්‍රගතිය ඇගයීමේදී ලද තොරතුරු කොපමණ දුරට ප්‍රයෝජනවත්ද සහ (ii) කොතරම් පහසුවෙන් එම තොරතුරු ලබා ගත හැකි වුවාද යන කරුණු දෙක මත ය.

තොරතුරු භාවිතයට සුදුසු වීම/ භාවිතා කිරීමේ හැකියාව: ලබා ගත් තොරතුරු, සම්පූර්ණයෙන් ප්‍රයෝජනයට ගත හැකි, අර්ධ වශයෙන් ප්‍රයෝජනයට ගත හැකි සහ කිසිසේත්ම ප්‍රයෝජනයට ගත නොහැකි යනුවෙන් බාණ්ඩ තුනකට වර්ග කර, පිලිවෙලින් 100, 50 සහ 0 වශයෙන් ලකුණු ලබා දෙන ලදී.

**තොරතුරු ලබා ගැනීමේ පහසුව:** ලබාගත් තොරතුරු වල ප්‍රයෝජනවත්බව අනුව ලබා දුන් ලකුණු, එම තොරතුරු ලබා ගැනීමේ පහසුව අනුව නැවත සකස් කරනු ලැබේ. මෙහිදී තොරතුරු දැනගැනීමේ පනත යටතේ ඉල්ලුම් කිරීමෙන් තොරතුරු ලබා ගැනීමේ හැකියාවට සාපේක්ෂව අන්තර්ජාලය හරහා ඉල්ලුම් කිරීමකින් තොරව තොරතුරු ලබා ගැනීමේ හැකියාවට වැඩි ලකුණු හිමි වෙයි.



## 1.3. ප්‍රගතිය මැනීම

මේ දර්ශකය යටතේ රජය තමන් සිදු කරන බව පැවසූ ක්‍රියාකාරකම් කෙතරම් දුරකට ඉටු කර ඇත්ද යන්න විමසා බැලේ. එනම් මෙහිදී පොරොන්දු ඉටු කිරීමේ ප්‍රගතිය ඇගයීමට ලක්කරයි. මෙම ඇගයීම කරන්නේ පොරොන්දුව ඉටුකිරීමට වගකිව යුතු රාජ්‍ය ආයතනය විසින්ම ප්‍රකාශයට පත් කරන ලද කාලසීමාවන් හා ඉලක්ක පදනම් කරගෙනය.

අයවැය පොරොන්දු වල *අර්ධ වාර්ෂික ප්‍රගතිය* පහත පරිදි වර්ගීකරණය කර ඇත.

| | |
|---|---|
| හෙළිකර නැත | ප්‍රගතිය ඇගයීමට කිසිදු තොරතුරක් නැත. නැතහොත් පවත්නා තොරතුරු ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් නැත |
| අතහැර දමා ඇත | මෙම පොරොන්දුව තක්සේරු කිරීමේ වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර නොමැත |
| නොසලකා හැර ඇත | මෙම පොරොන්දුව ක්‍රියාවට නැංවීමට සැලසුම් කර ඇතත් ක්‍රියාත්මක කිරීම ආරම්භ කර නැත |
| මන්දගාමී ප්‍රගතියක් ඇත | මෙම පොරොන්දුව ක්‍රියාවට නංවා ඇතිමුත් නියමිත කාලයට කටයුතු සිදු කිරීමට අසමත් වී ඇත |
| සතුටුදායක ප්‍රගතියක් ඇත | මෙම පොරොන්දුව ක්‍රියාවට නංවා ඇති අතර අදාළ ඉලක්කය අත්පත් කරගෙන හෝ ඉලක්කය අභිබවා ගොස් ඇත[3] |

අයවැය පොරොන්දු වල *වාර්ෂික ප්‍රගතිය* පහත පරිදි වර්ගීකරණය කර ඇත.

| | |
|---|---|
| **හෙළිකර නැත** | **ප්‍රගතිය ඇගයීමට කිසිදු තොරතුරක් නැත. නැතහොත් පවත්නා තොරතුරු ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් නැත/ ප්‍රයෝජනයට ගත නොහැක** |
| අතහැර දමා ඇත | වසරේ ක්‍රියාකාරී සැලසුමෙන් ඉවත්කර හෝ වසර තුල කිසිදු ප්‍රගතියක් වාර්තා කර නොමැත |
| දුර්වලයි | ඉලක්කගත ප්‍රගතියෙන් 33% වඩා අඩු ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත |
| අර්ධ සම්පූර්ණයි | ඉලක්කගත ප්‍රගතියෙන් 33%-66% අතර ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත. |
| සැළකිය යුතුයි | ඉලක්කගත ප්‍රගතියෙන් 66%-80% ත් අතර ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත |

[3] අයවැය පොරොන්දුවක් සතුටුදායක ප්‍රගතියක් ලබාඇති බවට වර්ගීකරණය කෙරෙනුයේ ජුනි 30වන දින වන විට අයවැය වර්ෂයේ ඉලක්ක වලින් 90% ක් වත් අදාළ කාලය තුළ නිම කර ඇත්නම් පමණි.

**සම්පූර්ණයි** ඉලක්කගත ප්‍රගතියෙන් 80% ඉක්මවූ ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත

# 2. ප්‍රතිපත්ති යෝජනා

2019 දී BudgetPromises.Org විසින් අයවැය කථාවේදී රජය විසින් කරන ලද ප්‍රතිපත්තිමය කැපවීම්වල ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා සිය විෂය පථය පුළුල් කළේය. මෙම යෝජනා සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමක් නොමැත.

ව්‍යවස්ථාදායක/ නීතිකාරක/ නීති සම්පාදක පැනවීමක් හෝ නියාමන දැනුම්දීම් (ගැසට්) "ක්‍රියාත්මක කර ඇත" හෝ "අර්ධ වශයෙන් ක්‍රියාත්මක කර ඇත" ලෙස සැලකීමට අවශ්‍යතාවය මත මෙම යෝජනා තෝරා ගන්නා ලදී. පොදුවේ ලබා ගත හැකි ගැසට් නිවේදන, රජයේ චක්‍රලේඛ, රජයේ තොරතුරු දෙපාර්තමේන්තුවේ කැබිනට් තීරණ පිළිබඳ නිවේදන වලින් තොරතුරු ලබා ගන්නා ලදී. ප්‍රතිපත්තිය පිළිබඳ පොදු තොරතුරු නොමැති විට, ලිපි, දුරකථන ඇමතුම් සහ විද්‍යුත් තැපැල් මගින් තොරතුරු සඳහා අමාත්‍යාංශහට සෘජුවම සම්බන්ධ විය.

## 2.1. ප්‍රගතිය මැනීම

අයවැය කථාවේ හඳුන්වා දී ඇති ප්‍රතිපත්ති යෝජනා ක්‍රියාත්මක කිරීමේදී රජය ලබා ඇති ප්‍රගතිය මෙමගින් විමසා බැලේ.

| | | |
|---|---|---|
| ? | **හෙළිකර නැත** | **ප්‍රගතිය ඇගයීමට කිසිදු තොරතුරක් නැත. නැතහොත් පවත්නා තොරතුරු ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් නැත** |
| ✕ | ක්‍රියාත්මක කර නැත | යෝජනාවේ කිසිදු කොටසක් සඳහා අවශ්‍ය ව්‍යවස්ථාදායක/ නීතිකාරක/ නීති සම්පාදක පැනවීමක් හෝ නියාමන දැනුම්දීම් (ගැසට්) ප්‍රකාශයට පත් කර නොමැත. අදාළ අමාත්‍යාංශය / රජයේ ආයතනය විසින් මෙය ලිඛිතව සනාථ කර ඇත. |
| ◑ | අර්ධ වශයෙන් ක්‍රියාත්මක කර ඇත | යෝජනාවේ සියලුම කොටස් සඳහා නොව සමහර කොටස් සඳහා අවශ්‍ය ව්‍යවස්ථාදායක/ නීතිකාරක/ නීති සම්පාදක පැනවීමක් හෝ නියාමන දැනුම්දීම් (ගැසට්) ප්‍රකාශයට පත් කර ඇත. |
| ✓ | සම්පූර්ණව ක්‍රියා ත්මක ක ර ඇත | ප්‍රතිපත්ති යෝජනාව සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කර ඇත. යෝජනාවේ සම්පූර්ණ විෂය පථය සඳහා අවශ්‍ය ව්‍යවස්ථාදායක/ නීතිකාරක/ නීති සම්පාදක පැනවීමක් හෝ නියාමන නිවේදනය (ගැසට් පත්‍රය) ප්‍රකාශයට පත් කර ඇති අතර වැඩිදුර ක්‍රියාමාර්ග අවශ්‍ය නොවේ. |

## 3. ප්‍රගතිය, විවෘතභාවය සහ ශ්‍රේණිගත කිරීමේ තක්සේරු පිළිබඳ විස්තර

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| ජාතික ඩිජිටල් හැඳුනුම්පත් ක්‍රමය හඳුන්වා දීම | විවෘත | සැළකිය යුතුයි | විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණ ඒජන්සිය |
| | අමාත්‍යාංශය විසින් ව්‍යාපෘතියෙහි ප්‍රගතිය පිලිබඳ සවිස්තරාත්මක තොරතුරු ලබා දෙන ලදි. | සම්පූර්ණ ව්‍යාපෘතිය නිම කිරීමට නියමිතව ඇත්තේ 2019 වසරේදීය. කෙසේ වෙතත් 2017 වසර සඳහා ඉලක්ක කර තිබූ ප්‍රගතිය සැළකිය යුතු ලෙස සාක්ෂාත් කර ගැනීමට ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය සමත් ව ඇත. ප්‍රසම්පාදනයෙහිදී සිදුවන ප්‍රමාදයන් හේතුවෙන් ව්‍යාපෘතියේ ප්‍රමාණය කප්පාදු කර ඇත. | |
| ජාතික ගෙවීම් වේදිකාව හා ජාතික තොරතුරු මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම | විවෘත | අර්ධ සම්පූර්ණයි | විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණ ඒජන්සිය |
| | අමාත්‍යාංශය විසින් ජාතික දත්ත මධ්‍යස්ථානයෙහි ප්‍රගතිය පිලිබඳ සවිස්තරාත්මක තොරතුරු ලබා දෙන ලදි. අදාල ආයතන වෙබ් අඩවියෙහි අයවැය ව්‍යාපෘති පිලිබඳ තොරතුරු ලබා දී තිබුනත් ජාතික ගෙවීම් වේදිකාව පිලිබඳ සඳහනක් නොමැත. | ඉඩම් ලබා ගැනීමේ ප්‍රමාදයන් හේතුවෙන් ජාතික දත්ත මධ්‍යස්ථානයෙහි වැඩ කටයුතු පසුගාමී වී ඇත. ජාතික ගෙවීම් වේදිකාවෙහි ප්‍රගතිය පිළිබඳව තොරතුරු සපයා නොමැත. | |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| මාර්ග ගාස්තු අය කිරීමේ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම | සාධනීය | අතහැර දමා ඇත | විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණ ඒජන්සිය |
| | අමාත්‍යාංශය විසින් ව්‍යාපෘතියෙහි ප්‍රගතිය පිලිබඳ සවිස්තරාත්මක තොරතුරු ලබා දෙන ලදි. | මෙම ව්‍යාපෘති යෝජනාව 2017 වසරේ ක්‍රියාකාරී සැලැස්මෙන් ඉවත් කර ඇත. | |
| විශේෂිත ලේඛන ආරක්ෂිත යතුරක් භාවිතය මඟින් දත්තවල ආරක්ෂාව තහවුරු කිරීම | සීමිත | සම්පූර්ණයි | විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණ ඒජන්සිය |
| | ප්‍රගතිය පිලිබඳ තොරතුරු ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවෙහි තුන්වන කාර්තුවෙහි වාර්තාව මඟින් ලබා ගන්න ලදි. අදාළ අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි මෙම ව්‍යාපෘතිය පිලිබඳ ඇතැම් තොරතුරු ඇතුළත් කර ඇත. | ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විසින් 2017 වසර සඳහා ඉලක්ක කර තිබූ වැඩ කොටසට වඩා වැඩි ප්‍රගතියක් වාර්තා කර ඇත. සම්පූර්ණ ව්‍යාපෘතිය නිම කිරීමට නියමිතව ඇත්තේ 2019 වසරේදීය. | |
| සියලුම රජයේ අමාත්‍යාංශ ,දෙපාර්තමේන්තු හා ආයතන වීඩියෝ සම්මන්ත්‍රණ ක්‍රමයක් මඟින් සම්බන්ධ කිරීම හා අන්තර් රාජ්‍ය ඩිජිටල් ලේඛන ක්‍රමයක් ඇති කිරීම | විවෘත | අර්ධ සම්පූර්ණයි | විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණ ඒජන්සිය |
| | ආයතනය විසින් ව්‍යාපෘතියෙහි ප්‍රගතිය පිලිබඳ සවිස්තරාත්මක තොරතුරු ලබා දෙන ලදි. | අන්තර් ආයතන ඩිජිටල් ලේඛන සහ වීඩියෝ සම්මන්ත්‍රණ පහසුකම් ක්‍රියාත්මක කිරීම 54%ක ප්‍රගතියක් වාර්තා කර ඇත. | |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| අසාර්ථක වන මුල්‍ය සමාගම් වලට සහාය වීම සඳහා මුල්‍ය වත්කම් කළමනාකරණ ඒජන්සියක් පිහිටුවීම | ආවෘත | හෙළිකර නැත | FAMA - මුදල් අමාත්‍යාංශය |
| | අදාළ අමාත්‍යාංශයෙහි නම් කළ නිලධාරියාට අභියාචනයක් ඉදිරිපත් කළ පසුද තොරතුරු දැනගැනීමේ ඉල්ලුම්පතට ප්‍රතිචාරයක් ලැබුනේ නැත. | ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් තොරතුරු නොමැත. | |
| ආනයන අපනයන බැංකුව (EXIM BANK) පිහිටුවීම | උදාසීන | අතහැර දමා ඇත | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය |
| | තොරතුරු දැනගැනීමේ ඉල්ලුම්පතට ලද ප්‍රතිචාරයට අනුව මෙම පොරොන්දුව අත්හැර දමා ඇත. ව්‍යාපෘතිය අවලංගු කිරීමට හේතුව සපයා තිබේ. | මෙම ව්‍යාපෘතිය 2017 වසරේ ක්‍රියාත්මක නොවේ. ප්‍රතිපාදන අයහපත් කාලගුණ තත්ත්වයන්ගෙන් ආපදාවට ලක් වූ දේපළ ප්‍රතිසංස්කරණයට යොදවා ඇත. | |
| නිවාස බැංකුවට අවශ්‍ය ප්‍රාග්ධනය යෙදවීම | උදාසීන | අතහැර දමා ඇත | රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය |
| | තොරතුරු දැනගැනීමේ ඉල්ලුම්පතට ලද ප්‍රතිචාරයට අනුව මෙම පොරොන්දුව අත්හැර දමා ඇත. ව්‍යාපෘතිය අවලංගු කිරීමට හේතුව සපයා තිබේ. | මෙම පොරොන්දුව 2017 වසරේ ක්‍රියාත්මක නොවේ. ප්‍රතිපාදන අයහපත් කාලගුණ තත්ත්වයන්ගෙන් ආපදාවට පත්වූ දේපළ ප්‍රතිසංස්කරණයට යොදවා ඇත. | |
| සුළු පරිමාණ ව්‍යාපාරවලට පොලී රහිත මුල්‍ය පහසුකම් සැලසීම | විවෘත | අතහැර දමා ඇත | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය |
| | අමාත්‍යාංශය විසින් නැවත වෙන් කරන ලද ප්‍රතිපාදන හා එහි මූල්‍ය ප්‍රගතිය පිළිබඳව තොරතුරු සපයන ලදි. | අමාත්‍යාංශයට අනුව මෙම පොරොන්දුව වෙනුවට ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක වේ. ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන මගින් ලබාදී ඇති ප්‍රතිපාදන භාවිතයට ගෙන ඇත. | |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
| --- | --- | --- | --- |
| විද්‍යාගාර උපකරණ හා ලී බඩු ඇතුළත්ව පාසල්වල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම | සීමිත | සැළකිය යුතුයි | අධ්‍යාපන අමාත්‍යාංශය |
| | ප්‍රගතිය පිලිබඳ තොරතුරු ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවෙහි තුන්වන කාර්තුවෙහි වාර්තාව මගින් ලබා ගන්න ලදි. අදාළ අමාත්‍යාංශයෙහි නම් කළ නිලධාරියාට අභියාචනයක් ඉදිරිපත් කළ පසුද තොරතුරු දැනගැනීමේ ඉල්ලුම්පතට ප්‍රතිචාරයක් ලැබුනේ නැත. | ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවෙහි තුන්වන කාර්තු වාර්තාවෙහි ඇති තොරතුරුවලට අනුව ව්‍යාපෘතියෙන් 75%ක් අවසන් කර ඇත. කෙසේවෙතත් වෙන් කර ඇති රු. 5000ක ප්‍රතිපාදනවලින් මෙම ව්‍යාපෘතියට යොදවා ඇත්තේ රු. මිලියන 1000ක් පමණි. ඉතිරි රු. මිලියන 4000ක මුදල අයහපත් කාලගුණ තත්ත්වයන්ගෙන් ආපදාවට ලක් වූ දේපළ ප්‍රතිසංස්කරණයට යොදවා ඇත. | |
| උසස් පෙළ ගුරුවරුන්ට හා සිසුන්ට නොමිලේ ටැබ් පරිගණක ලබා දීම | සීමිත | අර්ධ සම්පූර්ණයි | අධ්‍යාපන අමාත්‍යාංශය |
| | ප්‍රගතිය පිලිබඳ තොරතුරු ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවෙහි තුන්වන කාර්තුවෙහි වාර්තාව මගින් ලබා ගන්න ලදි. අදාළ අමාත්‍යාංශයෙහි නම් කළ නිලධාරියාට අභියාචනයක් ඉදිරිපත් කළ පසුද තොරතුරු දැනගැනීමේ ඉල්ලුම්පතට ප්‍රතිචාරයක් ලැබුනේ නැත. | ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවෙහි තුන්වන කාර්තු වාර්තාවෙහි ඇති තොරතුරුවලට අනුව ව්‍යාපෘතියෙන් 40%ක් අවසන් කර ඇත. | |
| එක පාසලකට උපරිම වශයෙන් පරිගණක 50ක් බැගින් කුලී පදනම මත පරිගණක ලබා ගැනීම | ආවෘත | හෙළිකර නැත | අධ්‍යාපන අමාත්‍යාංශය |
| | අමාත්‍යාංශය විසින් පොරොන්දුව පිලිබඳ ඇතැම් තොරතුරු ලබා දී ඇත. මූල්‍ය හා භෞතික ප්‍රගතිය පිලිබඳ තොරතුරු ලබා දී නොමැත. | ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් තොරතුරු නොමැත. | |
| | සීමිත | අර්ධ සම්පූර්ණයි | නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල නිවාස ව්‍යාපෘතිය | අමාත්‍යාංශය විසින් ව්‍යාපෘතියෙහි ප්‍රගතිය පිළබඳ ඇතැම් තොරතුරු සපයා ඇත. ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවෙහි තුන්වන කාර්තු වාර්තාවෙහි නිවාස ව්‍යාපෘති පිලිබඳ ඇතැම් තොරතුරු සපයා තිබේ. කෙසේ වෙතත් වෙබ් අඩවිවල සඳහන් වන තොරතුරු පොරොන්දුවෙහි සඳහන් ක්‍රියාකාරකම් හා සැසඳීමට අපහසුය. | වගකිවයුතු ආයතන තුනෙන් කිසිදු ආයතනයක් සම්පුර්ණ වසර සඳහා තොරතුරු සපයා නොමැත. වියදම් කරන ලද මුදල (මුළු වසර සඳහා නොවේ) ඇස්තමේන්තුගත මුදලෙහි ප්‍රතිශතයක් ලෙස ගෙන ප්‍රගතිය ඇගයීමට ලක් කර ඇත. | |
| පොලිස් දෙපාර්තමේන්තුවට නවීන උපකරණ ලබා දීම | ආවෘත | හෙළිකර නැත | නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය |
| | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ආයතනය පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් තොරතුරු ලබා දී නොමැත. | ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් තොරතුරු නොමැත. | |
| ග්‍රාමීය ප්‍රදේශවල මාර්ග සංවර්ධනය | උදාසීන | අර්ධ සම්පූර්ණයි | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය |
| | අමාත්‍යාංශය විසින් පොරොන්දුවෙහි මූල්‍ය ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් තොරතුරු ලබා දෙන ලදි. | මූල්‍ය ප්‍රගති වාර්තාවලට අනුව සංශෝධිත ප්‍රතිපාදනවලින් 65%ක් 2017 වසරේදී වියදම් කර ඇත. | |
| තරුණයින්ට වෘත්තීය පුහුණුව ලබා දීම | සාධනීය | සම්පුර්ණයි | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය |
| | ජාතික තරුණ සේවා සභාව සහ යොවුන් සේනාංකය විසින් එම ආයතනයන්හි ක්‍රියාකාරකම්වල ප්‍රගතිය පිලිබඳ සවිස්තරාත්මක තොරතුරු ලබා දෙන ලදි. | ජාතික තරුණ සේවා සභාව සහ යොවුන් සේනාංකය 80% කට වැඩි ප්‍රගතියක් වාර්තා කර ඇත. | |
| | විවෘත | දුර්වලයි | ආරක්ෂක අමාත්‍යාංශය |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| ආබාධිත රණවිරුවන්ට විශ්‍රාම වැටුප් ලබා දීම | අමාත්‍යාංශය විසින් ව්‍යාපෘතියෙහි මූල්‍ය ප්‍රගතිය පිලිබඳ තොරතුරු සපයා ඇත. අබාධිත රණවිරුවන්ට විශ්‍රාම වැටුප් ලබා දීම පිළිබඳව වෙබ් අඩවිවල සඳහන් වේ. කෙසේ වෙතත් එම තොරතුරු පොරොන්දුව හා සැසඳීමට අපහසුය. | ලබා දී ඇති තොරතුරුවලට අනුව මුළු ප්‍රතිපාදනවලින් 26%ක් වියදම් කර ඇත. | |
| "ගෝල්ඩන් කී" තැන්පකරුවන්ට ගෙවීම් සිදු කිරීම | සාධනීය | සම්පූර්ණයි | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා මහා බැංකුව |
| | මුදල් අමාත්‍යාංශය විසින් ප්‍රගතිය ඇගයීමට අවශ්‍ය ඇතැම් තොරතුරු ලබා දෙන ලදී. | මුදල් අමාත්‍යාංශය විසින් ලබා දී ඇති තොරතුරුවලට අනුව මෙම පොරොන්දුව සඳහා වෙන් කර ඇති රු. මිලියන 3000ක ප්‍රතිපාදනවලින් රු. මිලියන 2500ක් වැය කර ඇත. | |
| කුඩා වැව් 1,500 ප්‍රතිෂ්ඨාපනය කිරීම, ප්‍රතිසංස්කරණය හා රොන්මඩ ඉවත්කිරීම | විවෘත | අර්ධ සම්පූර්ණයි | කෘෂිකර්ම අමාත්‍යාංශය |
| | අමාත්‍යාංශය විසින් ව්‍යාපෘතියෙහි ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් තොරතුරු ලබා දෙන ලදි. | ප්‍රගති වාර්තාවලට අනුව අයවැය පොරොන්දුවෙහි සඳහන් වැව් 1500න් 972ක් ප්‍රතිසංස්කරණය කර ඇත. | |
| සෑම නගරයකම නවීන පහසුකම් සමානව සංවර්ධනය කිරීමට අවශ්‍ය ක්‍රියාත්මක සැලසුමක් සැකසීම | සීමිත | අර්ධ සම්පූර්ණයි | නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය |
| | අමාත්‍යාංශය විසින් 2017 ජූනි 30 වනදා තෙක් ව්‍යාපෘතියේ ප්‍රගතිය ලබා දෙන ලදි. | 2017 වසර මැද ප්‍රගති වර්තාවෙහි ලබා දී ඇති තොරතුරුවලට අනුව මෙම පොරොන්දුව අර්ධ සම්පූර්ණ ප්‍රගතියක් පෙන්නුම් කර ඇත. | |
| | සාධනීය | සම්පූර්ණයි | අධ්‍යාපන අමාත්‍යාංශය |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| පාසල් දරුවන් සඳහා රුපියල් 200,000ක් වටිනා රක්ෂණ ආවරණයක් සැපයීම | අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි රක්ෂණාවරණය පිළිබඳ තොරතුරු සපයා තිබේ. තොරතුරු දැනගැනීමේ පනත යටතේ කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කළ පසු අමාත්‍යාංශය විසින් වැඩිදුර තොරතුරු ලබා දෙන ලදි. | ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවෙහි තුන්වන කාර්තු වාර්තාවෙහි ඇති තොරතුරුවලට අනුව රක්ෂණාවරණය ක්‍රියාත්මක කොට ඇත. නමුත් රක්ෂණය මගින් ලබා දී ඇති මුදල් ප්‍රමාණය හෝ ප්‍රතිලාභීන් සංඛ්‍යාව පිළිබඳ සඳහනක් නොමැත. | |
| සියලුම පාසල් සඳහා මූලික පහසුකම් වන ජලය, විදුලිය සහ සනීපාරක්ෂක පහසුකම් සැපයීම | සීමිත | සැළකිය යුතුයි | අධ්‍යාපන අමාත්‍යාංශය |
| | ප්‍රගතිය පිළිබඳ තොරතුරු ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවෙහි තුන්වන කාර්තුවෙහි වාර්තාව මගින් ලබා ගන්න ලදි. අදාළ අමාත්‍යාංශයෙහි නම් කළ නිලධාරියාට අභියාචනයක් ඉදිරිපත් කළ පසුද තොරතුරු දැනගැනීමේ ඉල්ලුම්පතට ප්‍රතිචාරයක් ලැබුනේ නැත. | ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවෙහි තුන්වන කාර්තු වාර්තාවෙහි ඇති තොරතුරුවලට අනුව ව්‍යාපෘතියෙන් 73%ක් අවසන් කර ඇත. | |
| සේවා පියස ඒකක 1000 පිහිටුවීම | ආවෘත | හෙළිකර නැත | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණය අමාත්‍යාංශය |
| | අමාත්‍යාංශය විසින් තොරතුරු දැනගැනීමේ ඉල්ලුම්පතට ප්‍රතිචාර දක්වා නොමැත. | ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් තොරතුරු නොමැත. | |
| සූර්ය බලශක්තියෙන් ගෘහස්ථව විදුලිය | විවෘත | සම්පූර්ණයි | |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| නිපදවීම ධෛර්යමත් කිරීමට ණය යෝජනා ක්‍රමයක් හඳුන්වාදීම | අමාත්‍යාංශය විසින් ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් තොරතුරු ලබා දෙන ලදි. | ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කර ඇත. 2017 වසර අවසාන වන විට ණය ඉල්ලුම්පත් 298ක් ලියාපදිංචි කර ඇති අතර රු. 128,442.67ක මුදලක් පොළී සහනාධාර ලෙස ගෙවා ඇත. | |
| ලක් සතොස සහ ඔසුසල බලයලත් වෙළඳසැල් ජාලය පුළුල් කිරීම | සාධනීය | අර්ධ සම්පූර්ණයි | කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශය |
| | ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් මෙම ව්‍යාපෘතියෙහි ප්‍රගතිය පිලිබඳ තොරතුරු සපයා ඇත. | ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් ලබා දී ඇති තොරතුරුවලට අනුව රු. මිලියන 842ක් ලක් සතොස ශාඛා ව්‍යාප්ත කිරීමට යොදවා ඇත. කෙසේ වෙතත් මෙම මුදල යොදවා ඇත්තේ පොරොන්දුවෙහි සඳහන් ක්‍රියාකාරකම් සඳහා ද යන්න පැහැදිළි නැත. | |
| හම්බන්තොට, මඩකලපුව, සහ යාපනය ඇතුළුව වෙරළ ආශ්‍රිත දිස්ත්‍රික්ක 10 ක ධීවර ගම්මාන වැඩි දියුණු කිරීම | විවෘත | සැළකිය යුතුයි | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය |
| | අමාත්‍යාංශය විසින් ක්‍රියාකාරී සැලසුම්, මූල්‍ය හා භෞතික ප්‍රගති වාර්තා ඇතුළු සවිස්තරාත්මක තොරතුරු සපයන ලදි. | මෙම පොරොන්දුව යටතේ යටිතල පහසුකම් සහ ජීවනෝපාය සංවර්ධනය කිරීමෙහි සිට ජලජීවී වගාකර්මාන්ත වැඩිදියුණු කිරීම දක්වා නොයෙක් ව්‍යාපෘති ක්‍රියාත්මක වේ. එම ව්‍යාපෘති වලින් බොහොමයක් සැළකියයුතු භෞතික හා මූල්‍ය ප්‍රගතියක් වාර්තා කර ඇත. | |
| යාන් ඔය ව්‍යාපෘතිය | විවෘත | දුර්වලයි | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය |
| | අමාත්‍යාංශය විසින් ක්‍රියාකාරී සැලසුම්, මූල්‍ය හා භෞතික ප්‍රගති වාර්තා ඇතුළු සවිස්තරාත්මක තොරතුරු සපයන ලදි. | වෙල්ලේ සහ ඇළ මාර්ගයේ ඉදිකිරීම් කටයුතු මහජන විරෝධතා හා අයහපත් කාලගුණ තත්ත්වයන් හේතුවෙන් මන්දගාමී වී ඇත. මෙම පොරොන්දුව ඇගයීමට ලක් කර ඇත්තේ සම්පූර්ණ යාන් ඔය ව්‍යාපෘතිය සැලකිල්ලට | |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| | | ගෙන ය. අයවැය පොරොන්දුවෙන් වෙන් කර ඇති රු. 1000ක ප්‍රතිපාදන ඇගයීමට ලක් කර නැත. | |
| කරාපිටිය, අම්පාර සහ යාපනය යන රෝහල්වල ළමා චිකිත්සක සංකීර්ණ ඇති කිරීම | සීමිත | දුර්වලයි | සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය |
| | ප්‍රගතිය පිළිබඳ තොරතුරු ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවෙහි තුන්වන කාර්තුවෙහි වාර්තාව මගින් ලබා ගන්නා ලදි. අදාළ අමාත්‍යාංශයෙහි නම් කළ නිලධාරියාට අභියාචනයක් ඉදිරිපත් කළ පසුද තොරතුරු දැනගැනීමේ ඉල්ලුම්පතට ප්‍රතිචාරයක් ලැබුනේ නැත. | ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවෙහි තුන්වන කාර්තු වාර්තාවෙහි ඇති තොරතුරුවලට අනුව ව්‍යාපෘතියෙන් 2%ක් අවසන් කර ඇත. | |
| ලෝක වෙළඳපොළ කේන්ද්‍ර කරගත් ආයෝජන, සංචාරක සහ අපනයන වර්ධනය කිරීම | සීමිත | දුර්වලයි | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය |
| | මුදල් අමාත්‍යාංශය විසින් ව්‍යාපෘතියෙහි මූල්‍ය ප්‍රගතිය පිළිබඳ ඇතැම් තොරතුරු 2017 වසරෙහි සැප්තැම්බර් මාසය දක්වා සපයා තිබේ. | පොරොන්දුව ක්‍රියාත්මක කිරීමට වෙන්කර ඇති රු. මිලියන 500ක ප්‍රතිපාදනවලින් රු. මිලියන 97.8ක් අදාළ ආයතන 5කට ලබා දී ඇත. කෙසේවෙතත් ප්‍රතිපාදන යොදා ගෙන ඇති ආකාරය පිළිබඳව සඳහනක් නොමැත. | |
| අධිවේගී මාර්ග දෙපස නිදහස් වෙළඳ කලාප ඇති කිරීම | විවෘත | අර්ධ සම්පූර්ණයි | සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය |
| | මිල්ලනියෙහි භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිබඳ තොරතුරු සපයා ඇත. පැල්පොල සහ බිංගිරියෙහි ප්‍රගතිය පිළිබඳ ඇතැම් | මිල්ලනිය, පැල්පොල සහ බිංගිරිය නගරවල පිහිටවීමට නියමිත වෙළඳ කලාප සඳහා අවශ්‍ය ඉඩම්, ජලය, සහ විදුලිය ලබා ගැනීමට අදාළ මූලික වැඩ කටයුතු අවසන් කර ඇත. | |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| | තොරතුරු සපයා ඇත. මිල්ලැව, හොරණ පිළිබඳ කිසිදු තොරතුරක් ලබා දී නැත. | | |
| MICE සම්මන්ත්‍රණ ශාලාවක් ඉදි කිරීම | විවෘත | අතහැර දමා ඇත | සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය |
| | තොරතුරු දැනගැනීමේ ඉල්ලුම්පතට ලද ප්‍රතිචාරයට අනුව මෙම පොරොන්දුව අත්හැර දමා ඇත. ව්‍යාපෘතිය අවලංගු කිරීමට හේතුව සපයා තිබේ. | අවශ්‍ය ඉඩම් ලබා ගැනීමට ඇති නොහැකියාව හේතුවෙන් මෙම පොරොන්දුව 2017 වසරේදී ක්‍රියාත්මක නොවේ. | |
| ද්විත්ව දුම්රිය මාර්ග ඉදි කිරීම | සීමිත | දුර්වලයි | ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය |
| | ප්‍රගතිය පිළිබඳ තොරතුරු ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවෙහි තුන්වන කාර්තුවෙහි වාර්තාව මගින් ලබා ගන්නා ලදි. අදාළ අමාත්‍යාංශයට ඉදිරිපත් කළ තොරතුරු දැනගැනීමේ ඉල්ලුම්පත හරහා ඇතැම් තොරතුරු ලබා දෙන ලදි. | ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවෙහි තුන්වන කාර්තු වාර්තාවෙහි ඇති තොරතුරුවලට අනුව ව්‍යාපෘතියෙන් 2%ක් අවසන් කර ඇත. | |
| නිවාස සඳහා පොලී සහනාධාර ලබා දීම | සීමිත | සම්පූර්ණයි | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය |
| | අමාත්‍යාංශය විසින් ව්‍යාපෘතිය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සපයා ඇත. ණය යෝජනා ක්‍රමය පිළිබඳ තොරතුරු වෙබ් අඩවිවල සඳහන් වේ. | ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කර ඇත. මෙමගින් ලබා දී ඇති මුදල් ප්‍රමාණය හෝ ප්‍රතිලාභීන් සංඛ්‍යාව පිළිබඳ සඳහනක් නොමැත. | |
| දායක විශ්‍රාම වැටුප් ක්‍රමය | සාධනීය | අතහැර දමා ඇත | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණය අමාත්‍යාංශය |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| | ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් මෙම විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ තොරතුරු සපයා ඇත. | විශ්‍රාම වැටුප් ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නෛතික විධිවිධාන සැලසීම සඳහා මහජන විශ්‍රාම පනත කෙටුම්පත් කෙරෙමින් පවතී. | |
| දක්ෂිණ සංවර්ධනය | විවෘත | දුර්වලයි | නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය |
| | අමාත්‍යාංශය විසින් තොරතුරු දැනගැනීමේ ඉල්ලුම්පත හරහා ප්‍රගති වාර්තා සපයන ලදි. | වසරවසාන වන විට මෙම පොරොන්දුව 12%ක ප්‍රගතියක් වාර්තා කර ඇත. | |
| උතුරු පළාතේ ගොඩනැගිල්ලක් ඉදිකිරීම | උදාසීන | අතහැර දමා ඇත | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය |
| | තොරතුරු දැනගැනීමේ ඉල්ලුම්පත හරහා ලබාගත් තොරතුරුවලින් වාර්තා කර ඇත්තේ මෙම පොරොන්දුව අත්හැර දමා ඇති බවයි. ව්‍යාපෘතිය අවලංගු කිරීමට හේතු සපයා ඇත. 2018 වසරේ ද මෙම ව්‍යාපෘතිය ක්‍රියාමත්මක නොවේ. | පොරොන්දුව 2017 වසරේ ක්‍රියාත්මක නොවීය. මේ සඳහා වෙන් කළ ප්‍රතිපාදන අයහපත් කාලගුණ තත්ත්වයන්ගෙන් ආපදාවට ලක්වූ දේපළ ප්‍රතිසංස්කරණයට යොදා ඇත. | |
| ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ "සිරිසර පිවිසුම" වැඩසටහන ක්‍රියාත්මක කිරීම | විවෘත | අර්ධ සම්පූර්ණයි | ජනාධිපති ලේකම් කාර්යාලය |
| | අමාත්‍යාංශය විසින් ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය පිළිබඳ තොරතුරු සපයා ඇත. | 2017 වසර මැද මූල්‍ය ප්‍රගති වාර්තාවට අනුව මෙම පොරොන්දුව අර්ධ සම්පූර්ණ ප්‍රගතියක් පෙන්නුම් කර ඇත. | |

වගකීම්හරණය

මෙම වෙබ් අඩවියෙහි අන්තර්ගත වන තොරතුරු ලබා ගනු ලබන්නේ රජයේ වාර්තා, නිල ප්‍රකාශන, ප්‍රසිද්ධ වාර්තා, සහ තොරතුරු දැනගැනීමේ පණත යටතේ ලබාගත් තොරතුරු යනාදිය වෙතිනි. තවද, මෙම වෙබ් අඩවියේ පළ කරනු ලබන තොරතුරු කිසිවක් කිසිදු ආකාරයකින් වෙරිටේ රිසර්ච් ආයතනයේ හෝ එහි සාමාජිකයන්ගේ පෞද්ගලික අදහස් යැයි අර්ථකථනය කළ නොහැක. එමෙන්ම මෙම වෙබ් අඩවියේ ඇති යම් තොරතුරක ප්‍රතිඵලයක් ලෙසින් කිසියම් කෙනෙකු අප්‍රසිද්ධියට හෝ අපකීර්තියට පත්වුවහොත් එයට වෙරිටේ රිසර්ච් මොනයම් ආකාරයකින් හෝ වග කියනු නොලැබේ.

අපගේ වෙබ් අඩවිය සඳහා හැකිතාක් විශ්වාසදායී තොරතුරු ලබා ගැනීමට උපරිම ලෙස ක්‍රියාකළද, මෙම රැස් කරගත් තොරතුරුවල තිබිය හැකි අක්‍රමිකතා හෝ අතපසුවීම් නිසා එම තොරතුරු භාවිතයෙන් උද්ගත විය හැකි ගැටලුවලට වෙරිටේ රිසර්ච් හෝ BudgetPromises.org වෙබ් අඩිවයේ ක්‍රියාකාරීන් වග කියනු නොලැබේ.

එමෙන්ම වෙරිටේ රිසර්ච් ආයතනයේ පූර්ව ලිඛිත අනුමැතියකින් තොරව අප විසින් ප්‍රකාශයට පත් කරනු ලබන තොරතුරු වෙනස් කිරීමට, අන් තැනෙක ප්‍රකාශ කිරීමට, සම්ප්‍රේෂණය කිරීමට, හුවමාරු කිරීමට, විකිණීමට, ප්‍රතිනිර්මාණය කිරීමට, බෙදා හැරීමට, නැවත පළ කිරීමට, අභිවහනය කිරීමට, ප්‍රදර්ශනය කිරීමට හෝ කිසිදු වාණිජමය අරමුණකින් අපයෝජනය කිරීමට කිසිවෙකුට කිසිසේත් හිමිකම් නැත. එමෙන්ම වෙරිටේ රිසර්ච් ආයතනයේ අනුමැතිය සහිතව හෝ රහිතව BudgetPromises.org හි තොරතුරු භාවිතා කිරීමෙන් ඇති විය හැකි ප්‍රතිවිපාකවලටද අපි වග නොකියමු.

වෙරිටේ රිසර්ච් ආයතනය කිසිදු දේශපාලන පක්ෂයක් සහ/හෝ දේශපාලන අරමුණු ඇති සංවිධානයකට සහය හෝ අනුමැතිය නොදක්වන අතර එවැනි කිසිවක් වෙනුවෙන් පෙනී සිටීම හෝ නියෝජනය කිරීම ද නොකරයි.

මෙම වෙබ් අඩවියේ සඳහන් වන තොරතුරු මහජනයා අතර දැනුවත්භාවය නංවාලනු වස් කිසිදු අයකිරීමකින් තොරව සපයනු ලැබේ. එමෙන්ම වෙරිටේ රිසර්ච් ආයතනය හෝ BudgetPromises.org කණ්ඩායම කිසිදු පාර්ශවයක් සමඟ මෙම වෙබ් අඩවියේ සඳහන් තොරතුරු ලබාදීමට කිසිදු ගිවිසුමකට හෝ අවබෝධතාවකට එළඹ නැත.

මෙම වෙබ් අඩවියට ඇතුලත් වන්නේ budgetpromises.org විසින් විශ්ලේෂණය කර සම්පාදනය කරන ලද ස්වාධීන විශ්ලේෂණයන්හි ප්‍රතිඵල වන අතර එමඟින් දත්ත වල පවතින ප්‍රවණතාවයන් සහ හැසිරීම ඉදිරිපත් කර ඇත. එම තොරතුරුවලින් කිසිවක්, කිසිවකු විසින් ප්‍රතිඋත්පාදනය කරන්නට අදහස් කරන්නේනම් වෙරිටේ රිසර්ච් ආයතනයේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.